// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2092/3 - 2018 ඔක්තෝබර් මස 08 වැනි සඳුදා - 2018.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2018 අංක 01 දරන පළාත් පාලන සම්පත් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් 2018.10.02 දින සම්මත කරන ලදුව 2018.10.06 දින මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කොට ඇති ඉහත සඳහන් ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පළකරමි.

**සරත් ඒකනායක**
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය සහ
මුදල් හා ක්‍රමසම්පාදන,නීතිය හා සාමය,පළාත් පාලන,මිනිස්බල,අධ්‍යාපනික
හා සංස්කෘතික කටයුතු,සංචාරක,ප්‍රවාහන,ඉඩම්,සමුපකාර සංවර්ධන,වෙළෙඳ හා වාණිජ ආහාර
සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු,පරිසර සහ ආයෝජන සම්බන්ධීකරණ වෙනත්
අමාත්‍යාංශ යටතට නොගැනෙන විෂයන් භාර අමාත්‍යාංශය.

2018 ඔක්තෝබර් 08 වැනි දින,
කුණ්ඩසාලේ,
පල්ලේකැලේ,
පළාත් සභා සංකීර්ණයේ පිහිටි,
පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A - PG 4272 — 32 (2018/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මධ්‍යම පළාත් සභාවේ 2018 අංක 01 දරන පළාත් පාලන සම්පත් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

පූර්විකාව

මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ද, ඒවායේ මහජන නියෝජිතයින්, සහ කාර්යමණ්ඩලය ඉලක්ක කරගනිමින් මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා ද, පළාත් පාලන ආයතනවලට අවශ්‍ය තොරතුරු තාක්ෂණ දැනුම ළඟාකිරීම සහ ඊට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම, සංවිධානය සහ මෙහයවීම සඳහා ද, වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල මානව සම්පත් සංවර්ධනය සඳහා ද මධ්‍යම පළාතේ පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශාංගික විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක දිනය.

1.මෙම ප්‍රඥප්තිය 2018 අංක 01 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

## 1 වන කොටස
## පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීම

2. මෙම ප්‍රඥප්තිය තුළ නිශ්චිතව සඳහන් කරනු ලබන පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා "පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය"යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු මධ්‍යස්ථානය යනුවෙන් හඳුන්වනු ලබන) මධ්‍යස්ථානයක් මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවනු ලැබේ.

3. මෙහි මින්මතු අධ්‍යක්ෂක වශයෙන් හඳුන්වන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙහි තැනැත්තෙකු මෙම මධ්‍යස්ථානයේ ප්‍රධානියා වශයෙන්, විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු අතර ඔහු විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

4. මධ්‍යස්ථානයේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන කාර්යය මණ්ඩලය දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්යය මණ්ඩලය තුළින් කොමසාරිස්වරයා විසින් අනුයුක්ත කරනු ලැබිය යුත්තේය.

5. මධ්‍යස්ථානයේ අරමුණු පහත පරිදි විය යුතුය.

මධ්‍යස්ථානයේ අරමුණු

(1) මධ්‍යම පළාතේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතවරුන් සහ එම ආයතනවල කාර්ය මණ්ඩලය දැනුම, කුසලතා, සහ ආකල්පවලින් පරිපූර්ණ පිරිසක් බවට පත්කර පළාත් පාලන ආයතන කාර්යක්ෂම සහ ගුණාත්මක මහජන සේවාවන් සපයන ආයතන බවට පත්කිරීම.

(2) පළාත් පාලනය පිළිබඳව පළාතේ මහජන සංවිධාන සහ මහජනතාව සක්‍රිය ලෙස සහභාගි කර ගැනීම සඳහා දැනුවත් කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(3) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව පළාතේ පළාත් පාලන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය ආයතන, පළාත් සභා, ජාතික මෙන්ම විදේශීය රාජ්‍යයන්, දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, ආයතන හා පුද්ගලික අංශය, පුද්ගලයන් සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය හා තාක්ෂණික සහය ලබාගැනීම සහ සම්බන්ධීකරණය තුළින් පළාත් පාලන ආයතනවල ධාරිතා සංවර්ධනය.

(4) පළාත් පාලනය පිළිබඳව පළාත් පාලන ආයතන මට්ටමෙන් , පළාත් මට්ටමෙන්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් දැනුම බෙදාගැනීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

(5) බාහිර ආයතනවලින් මානව සම්පත් සංවර්ධනය සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා පහසුකම් සැලැස්වීම.

6. මධ්‍යස්ථානයේ බලතල පහත පරිදි වේ: මධ්‍යස්ථානයේ බලතල හා කාර්යයන්

(1) පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පාලනය කිරීම
(2) පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයේ ගිණුම් විධිමත්ව පවත්වාගෙන යාම
(3) පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයේ ගිණුම් වාර්තා ඉදිරිපත්කිරීම
(4) පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයට වත්කම් අත්කරගැනීම හා වත්කම් දැරීම
(5) පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයේ කටයුතුවලට අදාලව බාහිර පාර්ශවයන් සමග ගිවිසුම්වලට එළඹීම

7. මධ්‍යස්ථානයේ කාර්යයන් පහත පරිදි වේ:

(1) මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව, සහ සහකාර කොමසාරිස් කාර්යාල හා පළාත් පාලන ආයතන තොරතුරු තාක්ෂණය උපරිමයෙන් භාවිතා කරන ආයතන බවට පත්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ පුහුණුව ලබාදීම;
(2) පළාත් පාලන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා වන විවිධ පාඨමාලා සංවිධානය කිරීම හා පැවැත්වීම;
(3) කළමණාකරණ කමිටුව විසින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම හා තොරතුරු ලබා දීම;
(4) කළමණාකරණ කමිටුව හා උපදේශක කමිටුව අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම;
(5) පුහුණු වැඩසටහන් හා සේවා සැපයීම මගින් ආදායම් උත්පාදනය කිරීම;
(6) සම්පත් මධ්‍යස්ථානයේ ලියාපදිංචිය සඳහා ප්‍රතිලාභින්ගෙන් ගාස්තු අයකිරීම;

8. මධ්‍යස්ථානයේ කාර්යයන් පාලනය කිරීම මෙහෙයවීම හා අධීක්ෂණය සඳහා (මෙහි මින් මතු'කමිටුව' යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ කමිටුවක් පිහිටුවනු ලැබිය යුත්තේය.

(1) කළමණාකරණ කමිටුව නිල බලයෙන් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය. කළමනාකරණ කමිටුව

(අ) විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියෙකු
(ආ) කොමසාරිස්වරයා,
(ඇ) මහනුවර, මාතලේ, සහ නුවරඑළිය, දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන්,
(ඈ) පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය),
(ඉ) අධ්‍යක්ෂ,

9. අමාත්‍යාංශයේ ලේකම්වරයා, කමිටුවේ සභාපති වරයා විය යුතු අතර, ලේකම්වරයා බලය පවරන ලද නිලධාරියෙකු නම්කර තිබේනම් කොමසාරිස්වරයා කමිටුවේ සභාපතිවරයා විය යුතුය. අධ්‍යක්ෂකවරයා කමිටුවේ ලේකම් වියයුතුය. කළමනාකරණ කමිටුවේ සභාපති හා ලේකම්

10. කළමනාකරණ කමිටුවේ බලතල හා කාර්ය පහත පරිදි වන්නේය: කළමනාකරණ කමිටුවේ බලතල හා කාර්යයන්

(1) මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සැළසුම් සකස් කිරීම,ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය පසුවිපරම් කිරීම, ඇගයීම සඳහා අවශ්‍ය සියළු පරිපාලන තීරණ ගැනීම.

(2) මධ්‍යස්ථානයේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය සියළු පියවර ගැනීම,

(3) මධ්‍යස්ථානයේ කාර්යයන් ඉටුකරගැනීම සඳහා අවශ්‍ය වන මුදල් යොදවාගන්නා ආකාරය තීරණය කිරීම.

(4) අවශ්‍ය යැයි සිතන අවස්ථාවලදී උපදේශක මණ්ඩලයෙන් උපදෙස් ලබාගැනීම හා සුදුසු පරිදි එවා ක්‍රියාත්මක කිරීම

කමිටු රැස්වීම

11. අවම වශයෙන් මාස දෙකකට වරක් කමිටුව රැස්විය යුතුය.

කමිටුවේ සණ පූර්ණය

12. රැස්වීමේ සණපුරණය කළමනාකරණ කමිටු සාමාජිකයන් හතර දෙනෙකු විය යුතුය.

උපදේශක කමිටුව

13. (1) කළමනාකරණ කමිටුවේ කාර්යයන් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම් ලබාදීම සඳහා මෙහි මින්මතු උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනුලබන, කමිටුවක් විය යුතු අතර, එම උපදේශක කමිටුවේ සාමාජිකයන් පහත පරිදි විය යුතුයඃ

නිල බලයෙන් පත්කරනු ලබන

(අ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්, හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියෙකු,
(ආ) මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යංශයේ ලේකම්වරයා,
(ඇ) පළාත් පාලන කොමසාරිස්වරයා.

පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන

(ඇ) මහා නගර සභාවක නගරාධිපතිවරයෙක්,
(ඈ) නගර සභාවක සභාපති වරයෙක්,
(ඉ) මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා නියෝජනය වන පරිදි සභාපතිවරු දෙදෙනෙක්

(2) ප්‍රධාන ලේකම්වරයා උපදේශක කමිටුවේ සභාපතිවරයා වියයුතු අතර පළාත් පාලන විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වියයුතුය.

(3) උපදේශක කමිටුවේ නිලකාලය වසර තුනකි.

(4) කමිටු සාමාජිකත්වය අවසන් වන අවස්ථා පහත පරිදි වේඃ

(අ) උපදේශක කමිටුවට පත්කල සාමාජිකයෙකුගේ මියයාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය අහෝසි වීම;

(ආ) විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයෙකු ඕනෑම අවස්ථාවක අමාත්‍යවරයා විසින් ලිඛිත හේතු දැක්වීමකින් පසුව ඉවත් කළ හැකිය;

(ඇ) ඉවත්කිරීමෙන් පත්කරනු ලබන අනුප්‍රාප්තිකයාට ඉතිරි නිල කාලය සඳහා ධුරය දැරිය හැකිය;

(5) පළාත් පාලන ආයතන විසුරුවා ඇති අවස්ථාවකදී පළාත් පාලන ආයතනයේ කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති නිලධාරියෙකු උපදේශක කමිටුව සඳහා පත්කිරීම නීත්‍යානුකූල වන්නේය.

පාරිශ්‍රම ගෙවීම

14. කමිටුවක සාමාජිකයන්ට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් පාරිශ්‍රම ගෙවනු ලැබිය හැකිය.

## 11 කොටස

### පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානයේ මුදල් හා ගිණුම් කටයුතු

15 (1) මධ්‍යස්ථානය සඳහා පළාත් භාණ්ඩාගාරයේ නියමය පරිදි වෙනම ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර පහත සඳහන් කරනු ලබන ලැබීම් අදාළ ගිණුමට බැර කරනු ලැබිය යුතුය. මූල්‍ය කටයුතු

(අ) මධ්‍යස්ථානය සඳහා පළාත් සභාව විසින් වරින්වර ලබාදෙන මුදල්,
(ආ) ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන මුදල් වෙනත් ආධාර හා ප්‍රදානයන්
(ඇ) පළාත් පාලන ආයතනවලින් ලැබෙන දායක මුදල්,
(ඈ) මධ්‍යස්ථානය තම කාර්යයන් ඉටුකිරීමෙන් රැස්කරනු ලබන හෝ අයකරනු ලබන මුදල්,
(ඉ) මධ්‍යස්ථානයට ලැබෙන වෙනත් ආධාර හා ප්‍රදානයන්.

(2) කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍යවන මුදල් කළමනාකරණ කමිටුව විසින් තීරණ කරනු ලබන ආකාරයට යොදාගත යුත්තේය.

(3) ගිණුමේ මුදල් වර්ෂය සෑම වර්ෂයකම ජනවාරි මස පළමුවන දින සිට එම වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනිදා දක්වා විය යුතුය. මුදල් වර්ෂය

(4) එක් එක් මුදල් වර්ෂයක් වෙනුවෙන් මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් සහ වෙනත් සියලු ගනුදෙනු ඇතුළත් වාර්ෂික පාලන වාර්තාවක් සමඟ ගිණුම් ප්‍රකාශයක් පිළියෙළ කලයුතුය. පෙර වර්ෂයේ ගිණුම් වාර්තා ඊලඟ වර්ෂයේ මාර්තු මස තිස් එක්වැනි දිනට පෙර අමාත්‍යවරයා විසින් පළාත් සභාව වෙත ඉදිරිපත් කලයුතුය. ගිණුම් ප්‍රකාශ

16. මධ්‍යස්ථානයේ කටයුතු සහ එහි ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතුය. ගිණුම් විගණනය

17. මධ්‍යස්ථානය අල්ලස් පනත යටතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන යටතේ කටයුතු කළ යුතුය. අල්ලස් පනතේ කාර්යය සඳහා උපලේඛනගත ආයතනයක් බව.

### පොදු විධිවිධාන

18. (1) මධ්‍යස්ථානයේ අරමුණු සහ කළමණාකරණ කමිටුවේ බලතල හා කර්තව්‍ය ඉටුකරගැනීමට අවශ්‍ය වන්නා වූ කාරණයන් සම්බන්ධයෙන් රීතී සෑදීමේ බලය අමාත්‍යවරයාට ඇත්තේය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පලකරනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයේ පලකරනු ලැබීමෙන් පසු මසක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම

(3) පළාත් සභාව විසින් සම්මත කරනු නොලැබූ යම් රීතියක් එකී අනනුමත දිනයේ සිට එකී රීතියක් යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ජින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. යම් රීතියක් පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳව නිවේදනය ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

19. මෙම ප්‍රඥප්තියේ යම් ප්‍රතිපාදනයක් හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද රෙගුලාසියක හෝ නියෝගයක හෝ යම් විධිවිධානයක් හෝ විධිවිධාන උල්ලංඝනය කිරීම සහ එම විධිවිධාන අනුව ක්‍රියාකිරීමේ බලය ඇති අයෙකුට තම රාජකාරී කටයුතු කිරීමට බාධා කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී, රුපියල් දසදහස නොඉක්මවන දඩයක් හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය. වැරදි හා දණ්ඩන

20. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අදහස් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එහිදී සිංහල පාඨය බල පැවැත්විය යුතුය.

අර්ථ නිරූපනය

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි,

''පළාත් සභාව'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාවද,

''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් ආණ්ඩුකාරවරයාද,

''අමාත්‍යවරයා'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාද,

''අමාත්‍යාංශ ලේකම්'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාද,

''කොමසාරිස්වරයා'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාද,

''දෙපාර්තමේන්තුව'' යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවද,

''උපදේශක කමිටුව'' යන්නෙන් සම්පත් මධ්‍යස්ථානයේ උපදේශක කමිටුව ද, අදහස් වේ.

10- 1274

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.